සැබැවින්ම අල්ලාහ් අපරාධකරුට කල් ලබා දෙයි. අවසානයේ ඔහු ඔහුව ග්රහණය කළ විට ඔහුව අත් නොහරියි

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ මූසා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "සැබැවින්ම අල්ලාහ්
අපරාධකරුට කල් ලබා දෙයි. අවසානයේ ඔහු ඔහුව ග්රහණය කළ විට ඔහුව අත් නොහරියි." යැයි පවසා පසුව "තවද ගමක අපරාධ සිදු වෙමින් තිබිය දී එය නුඹේ පරමාධිපති ග්රහණය කළ විට, ඔහුගේ ග්රහණය එලෙසම වේ. නියත වශයෙන්ම ඔහුගේ ග්රහණය දැඩි වේදනා සහගතය." යන (හූද්:
102 වැනි) පාඨය පාරායනය කළහ. [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

පිටුපාමින් අපරාධ කිරීම, අල්ලාහ්ට ආදේශ කිරීම හා මිනිස් අයිතිවාසිකම්වලදී ඔවුනට අපරාධ කිරීම යනාදියෙහි සීමාව ඉක්මවා කටයුතු කිරීම ගැන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ අවවාද කළහ. සැබැවින්ම උත්තරීතර අල්ලාහ් අපරාධකරුවාට කල් දෙයි. ඔහුව ප්රමාද කරයි. ඔහුගේ ආයුකාලයෙහි හා ඔහුගේ ධනයෙහි ඔහුට දීර්ග කරයි. නමුත් දඬුවම ඉක්මන් නොකරයි. නමුත් ඔහු පාපක්ෂමාවෙහි නිරත නොවූයේ නම්, ඔහුව ග්රහණය කරනු ලබන අතර ඔහු ඉන් ඉවත්ව නොයනු ඇත. ඔහුගේ අධික අපරාධ හේතුවෙන් කිසිවිටෙක ඔහුව අත් නොහරිනු ඇත. පසුව "තවද ගමක අපරාධ සිදු වෙමින් තිබිය දී එය නුඹේ පරමාධිපති ග්රහණය කළ විට, ඔහුගේ ග්රහණය එලෙසම වේ. නියත වශයෙන්ම ඔහුගේ ග්රහණය දැඩි වේදනා සහගතය." යන (හූද්: 102 වැනි) පාඨය එතුමාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) පාරායනය කළහ.

https://sunnah.global/hadeeth/si/show/5811